දැන්වීම් පුවරුවේ ප්‍රදර්ශනය කිරීම සඳහා

# යටියන්තොට ප්‍රාදේශීය සභාව
# ප්‍රසම්පාදන දැන්වීම

යටියන්තොට ප්‍රාදේශීය සභාව සතුව ඇති **SGRX 6712** හා **SGRX 2003** අංක දරන ජල බවුසර් දෙක හා **SGRW 8877** අංක දරන ට්‍රැක්ටර් ටේලරය අලුත්වැඩියා කිරීමට අදාළව **2025.08.13** වන දින පෙ.ව **11.30** දක්වා මා විසින් මිල ගණන් කැඳවනු ලැබේ.

එම යන්ත්‍ර යටියන්තොට ප්‍රාදේශීය සභා වාහන අංගනයේ දී පරීක්ෂා කළ හැකි අතර ,අලුත්වැඩියා කළ යුතු කොටස් ඇතුළුව එක් එක් වාහන සඳහා වෙන් වෙන්ව (අදාළ වාහනයේ නම ඇතුළත්ව) විස්තරාත්මකව මිල ගණන් ඉදිරිපත් කරන්න. **SGRX 2003** අංක දරන ජල බවුසරය අලුත්වැඩියා කළ යුත්තේ සුදු යකඩ වලින් බව සැලකිය යුතුය.

ඔබ විසින් ඉදිරිපත් කරනු ලබන මිල ගණන් එදින හෝ එදිනට ප්‍රථම මෙම කාර්යාලයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ තැන්පත් කළ හැකි අතර එසේ නොමැති නම් **"සභාපති, ප්‍රාදේශීය සභාව, යටියන්තොට"** යන ලිපිනයට එවිය හැකිය. මිල ගණන් එවනු ලබන කවරයේ වම් පස ඉහළ කෙළවරේ **"SG RX 6712, SGRX 2003 අංක දරන ජල බවුසර් දෙක හා SGRW 8877 අංක දරන ට්‍රැක්ටර් ටේලරය අලුත්වැඩියාව සඳහා මිල ගණන් "** යනුවෙන් සඳහන් කරන්න.

**2025.08.13** දින පෙ.ව **11.30** ට යටියන්තොට ප්‍රාදේශීය සභා කාර්යාලයේදී මිල ගණන් විවෘත කරන අතර එම අවස්ථාවසඳහා ඔබ ආයතනයේ නියෝජිතයෙකු සම්බන්ධ කළ හැක. ඔබ විසින් ඉදිරිපත් කරනු ලබන මිල ගණන්වල වලංගු කාලය සහ එම භාණ්ඩ කාර්යාලය වෙත ප්‍රවාහනය කර දීම වෙනුවෙන් යන වියදම ද සමග මිල ගණන් ඉදිරිපත් කරන්න. ප්‍රවාහනය කර දීමට නොහැකි නම් ඒ බවද මිල ගණන් පත්‍රයේ සඳහන් කරන්න.
වැඩි විස්තර සඳහා දුරකථන අංක **0714991381/ 0707544351** අමතන්න.

**ඩී.කේ.ටී.ඩී.දෙවනගුරු**
සභාපති
ප්‍රාදේශීය සභාව
යටියන්තොට

සැපයුම්කරුවන්ගේ නම සහ ලිපිනය

......................................................
......................................................
......................................................

......................................................
(අත්සන හා නිල මුද්‍රාව තබන්න)

2025 ජූලි මස 29 දින
යටියන්තොට ප්‍රාදේශීය සභාවේදිය